# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2081/47 - 2018 ජූලි මස 26 වැනි බ්‍රහස්පතින්දා - 2018.07.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය*: YAK/LAND/01/03/15.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/7/2016/HW/321.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තරය:*

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පෙ පත්තුව උතුරට, යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ යක්කලමුල්ල ප්‍රාදේශීය සීමාව තුළ 181 වල්පොල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වල්පොල ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද අවසාන ගම් පිඹුරු අංක 645 හි අතිරේක අංක 19 දරන පත්‍ර අංක 22 හි කැබලි අංක 963,964, 965, 966 ලෙස පෙන්නුම් කර ඇති හෙක්ටයාර් 0.0123 ක් වූ පහත නම් වලින් හා මායිම්වලින් යුත් බිම් කොටස් සඳහා මායිම් -

**කැබලි අංක 963**
ඉඩමේ නම: කලුකඳවත්ත; හිමිකම් කියන අය: රජය; ඉඩම් පරිහරණය: විවෘත මුඩුබිම; මුල් හිමිකම් පාන්නා: ඩබ්. කේ. කරුණාපාල, ඉහළ වල්පොල, ඉමදූව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0013 ක් පමණ වේ.

**කැබලි අංක 964**
ඉඩමේ නම: පතිරණගෙවත්ත; හිමිකම් කියන අය: රජය; ඉඩම් පරිහණය: ගෙවත්ත; මුල් හිමිකම් පාන්නා: එම්. කේ. පී. කල්‍යාණවංශ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0076 ක් පමණ වේ.

**කැබලි අංක 965**
ඉඩමේ නම: පතිරණගෙවත්ත; හිමිකම් කියන අය: රජය; ඉඩම් පරිහණය: ගෙවත්ත; මුල් හිමිකම් පාන්නා: එම්. කේ. පී. කල්‍යාණවංශ, ජයන්ති, ඉහලපල්ලව, ඉමදූව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0014 ක් පමණ වේ.

**කැබලි අංක 966**
ඉඩමේ නම: කෝන්ගස්ගොඩවත්ත, කැටිගලඹිකන්ද, බරලියමුල්ලගොඩ, මිල්ලගහවත්ත, දෙපෙලෙගොඩවත්ත; හිමිකම් කියන අය: රජය; ඉඩම් පරිහණය: ගෙවත්ත, සිමෙන්ති බැම්මක කොටසක් ඇත; මුල් හිමිකම් පාන්නා: එම්. කේ. ලීලාවතී, ජයන්ති, ඉහලපල්ලව, ඉමදූව ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0020ක් පමණ වේ.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2018 අගෝස්තු මස 27 වැනි දින පෙ. ව. 10.00 ට ගාල්ල, යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2018 අගෝස්තු මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වාභාවයත් එකී ඉඩම්/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

චන්දිම සී. මුහන්දිරම්ගේ,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
යක්කලමුල්ල.

2018 ජූලි මස 02 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 466

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : 3/6/2016/15-1/2018.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/7/2016/HW/36.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය:*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩපොල මැදලැස්සෙ කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 889 ලිහිනිගිරිය ග්‍රාම නිලධාරී වසමට අයත් ලිහිනිගිරිය ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක මූ.පි.අ. කු 2399, පත්‍රය අංක 1 දරන සැලැස්මේ පෙන්නුම් කර ඇති පහත විස්තර සඳහන් ඉඩම් කැබලි.

1. **කැබලි අංක 1**
ඉඩමේ නම: මහවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: අධිකාරි මුදියන්සේලාගේ මොරිනි කුසලිතා බණ්ඩාර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0812

2. **කැබලි අංක 2**
ඉඩමේ නම: මහවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: රණතුංග ජයසේකර කෝරළගේ සීලවතී; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0422

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2018 අගෝස්තු මස 01 වැනි දින පෙ. ව. 10.00 ට පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2018 ජූලි මස 30 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වාභාවයත් එකී ඉඩම්/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඩී. අනෝමා දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
පොල්ගහවෙල.

2018 ජූලි මස 02 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 467

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.